අද දින පවත්වන ලද රැස්වීමේදී තේරීම් කාරක සභාවට නාම යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධව එකඟතාවයකට එළඹීමට නොහැකි විය. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 114 යටතේ පාර්ලිමේන්තුව විසින් පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂවල නායකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඇතුලත්ව මාගේ සභාපතිත්වයෙන් 12 දෙනෙකුගෙන් එම කාරක සභාව පත් කළ යුතුය.

මා ඉහතින් සඳහන් කළ ආකාරයට මෙම පත්කිරීම් පිළිබඳව පක්ෂ නායකයන්ගේ එකඟතාවයක් නොමැති වූ බැවින්, ස්ථාවර නියෝග 136 සහ 143 යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත නම් සඳහන් සභික මන්ත්‍රීන් තේරීම් කාරක සභාව සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා නම් කර සිටිමි.

1. එක්සත් ජනතා නිදහස් සන්ධානය
    - ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
    - ගරු එස්. බී. දිසානායක මහතා
    - ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
    - ගරු මහින්ද සමරසිංහ මහතා සහ
    - ගරු විමල් වීරවංශ මහතා

2. එක්සත් ජාතික පක්ෂය
    - ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
    - ගරු රවුෆ් හකීම් මහතා
    - ගරු රිෂාද් බදියුදීන් මහතා
    - ගරු මනෝ ගනේෂන් මහතා සහ
    - ගරු පාටලී චම්පික රණවක මහතා

3. ඉලංගෙයි තමිල් අරසුකච්චි
    - ගරු මාවෙයි සේනාධිරාජා මහතා

4. ජනතා විමුක්ති පෙරමුණ
    - ගරු විජිත හේරත් මහතා